සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 08 - 2023

## විද්‍යාව - I

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. හරිත ශාක ප්‍රභාසංශ්ලේෂණයේ දී යොදා ගන්නා අභ්‍යන්තර සාධක වන්නේ,
   1) කාබන්ඩයොක්සයිඩ්
   2) ජලය
   3) හරිතප්‍රද (ක්ලෝරොෆිල්)
   4) ආලෝක ශක්තිය

2. පහත සඳහන් ජීවී ලක්ෂණ සලකා බලන්න
   a. ද්විපාර්ශ්වික සමමිතියක් දක්වයි.
   b. සිහින් දිග පණු ආකාර දේහ දරයි.
   c. දේහය ඛණ්ඩවලට බෙදී ඇත.

   මෙම ලක්ෂණ අයත් සත්ත්ව කාණ්ඩය වන්නේ,
   1) ආත්‍රොපෝඩා
   2) ඇනෙලිඩා
   3) මොලුස්කා
   4) නිඩාරියා


3. ප්‍රෝටීන් බහුලව අඩංගු ආහාර මත ක්ෂුද්‍ර ජීවීන් වැඩීම නිසා ඇතිවන වෙනස්වීම කුමන නමකින් හැඳින්වේද?
   1) පූතිභවනය
   2) කුණු වීම
   3) පැසීම
   4) මුඩු වීම

4. මිනිස් මොළයට අයත් කොටසක් **නොවන්නේ**,
   1) මස්තිෂ්කය
   2) අනුමස්තිෂ්කය
   3) සුෂුම්නාව
   4) සුෂුම්නා ශීර්ෂකය

5. මිනිස් සමේ අජීවී සෛලවලින් සෑදී ඇති කොටස වන්නේ,
   1) ස්නේහස්‍රාවී ග්‍රන්ථිය
   2) අපිචර්මය
   3) චර්මය
   4) ස්වේද ග්‍රන්ථි

6. ස්කන්ධය, විද්‍යුත් ධාරාව , විද්‍යුත් ප්‍රතිරෝධය යන රාශි මනිනු ලබන ඒකක පිළිවෙලින්,
   1) කිලෝග්‍රෑම්, ඇම්පියර්, ඕම්
   2) නිව්ටන්, මිලි ඇම්පියර්, ඕම්
   3) නිව්ටන්, ඇම්පියර්, ඕම්
   4) කිලෝග්‍රෑම්, වෝල්ට්, ඕම්

7. Z බල්බය දැල්වීම සඳහා සංවෘත (ON) කළ යුතු ස්විච වන්නේ,




1) $S_1$ සහ $S_3$ 2) $S_1$ සහ $S_2$ 3) $S_2$ සහ $S_3$ 4) $S_2$ සහ $S_4$

8. පහත සඳහන් ද්‍රව්‍ය වලින් භංගුරතාවය සහිත ද්‍රව්‍ය වන්නේ,

1) ඊයම් 2) තඹ 3) සල්ෆර් 4) යකඩ

9. යම් ද්‍රව්‍යයක තාපාංකය පිළිබඳ නිවැරදි වගන්තිය කුමක්ද ?

1) තාපාංකයේදී ඝනයක් ද්‍රවයක් බවට පත් වේ.
2) කඳු මුදුනේදී සංශුද්ධ ජලයේ තාපාංකය 100 $^0$C ට වැඩිය.
3) තාපාංකයේදී ද්‍රවයක් වායුවක් බවට පත් වේ.
4) වායුගෝලීය පීඩනය වැඩිවන විට තාපාංකය අඩු වේ.

10. භෞතික විපර්යාසයකට උදාහරණයකි,

1) යකඩ මල බැඳීම
2) රතිඤ්ඤා කරලක් දැල්වීම
3) කඩදාසියක් දහනය
4) ද්‍රව ඉටි වාෂ්ප වීම




11. චුම්භක තැනීමට චුම්භක ද්‍රව්‍ය ලෙස භාවිතයට ගත හැක්කේ,

1) පර්පෙක්ස් දණ්ඩ
2) ෆෙරයිට් දණ්ඩ
3) ඇලුමිනියම් දණ්ඩ
4) ඇස්බැස්ටෝස් දණ්ඩ

12. අසම්පූර්ණ රූපාන්තරණය පෙන්වන සත්ත්වයා වන්නේ,

1) මදුරුවා,
2) කැරපොත්තා
3) ගෙමැස්සා
4) පළතුරු මැස්සා

13. LDR පරිපථ සංකේතය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

1)  2)  3)  4) 

14. තම ජීවන චක්‍රයේ අවධිවල රූපීය වෙනසක් **නොපෙන්වන** ජීවියා,

1) ලේනා
2) ගෙම්බා
3) මදුරුවා
4) ගෙමැස්සා

15. රාත්‍රී අහසේ නැගෙනහිර සිට බටහිර දිශාවට චලනය නොවන සේ පෙනෙන තාරකාව වන්නේ,

1) ඇල්ෆා සෙන්ටෝරි
2) පෝලාරිස්
3) පොලක්ස්
4) රෙගියුලස්

16. මධ්‍ය ස්නායු පද්ධතියේ පහත සඳහන් කොටස් වලින් ඉටු කෙරෙන කාර්යය නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,

1) සුෂුම්නාව - උසස් මානසික ක්‍රියා පාලනය කිරීම
2) මස්තිෂ්කය - හෘද ස්පන්දන වේගය පාලනය කිරීම
3) අනුමස්තිෂ්කය - දේහයේ සමතුලිතතාව පාලනය කිරීම
4) සුෂුම්නා ශීර්ෂකය - ඉච්ඡානුග ක්‍රියා පාලනය කිරීම

17. සන්නායකයක ප්‍රතිරෝධය කෙරෙහි බල නොපාන සාධකය වන්නේ,

1) සන්නායකයේ දිග
2) සන්නායකයේ හරස්කඩ වර්ගඵලය
3) සන්නායකයේ පෘෂ්ඨ ස්වභාවය
4) සන්නායකය සෑදී ඇති ද්‍රව්‍යය

18. භූගත කඳන් මඟින් සිදුකරන කාර්යයක් **නොවන්නේ,**

1) කාලතරණය
2) ආහාර සංචිත කිරීම
3) ප්‍රභාසංශ්ලේෂණය
4) වර්ධක ප්‍රචාරණය

19. තත් කම්පනයෙන් හඬ උපදවන භාණ්ඩයකින් නිකුත් වන හඬෙහි සංඛ්‍යාතය පිළිබඳ නිවැරදි වරණය දැක්වෙන්නේ,

1) තතෙහි ඇදී ඇති ප්‍රමාණය වැඩිවන විට නිකුත්වන හඬෙහි සංඛ්‍යාතය අඩුය.
2) තතෙහි ඝනකම වැඩිවන විට නිකුත්වන හඬෙහි සංඛ්‍යාතය වැඩිය.
3) තතෙහි දිග වැඩිවන විට නිකුත්වන හඬෙහි සංඛ්‍යාතය වැඩිය.
4) තතෙහි ඝනකම අඩුවනවිට නිකුත්වන හඬෙහි සංඛ්‍යාතය වැඩිය.

20. වර්ෂා කාලයත් සමඟ බහුලව දක්නට ලැබෙන රෝගී තත්වයක් **නොවන්නේ,**

1) ජලභීතිකාව
2) පාචනය
3) ඩෙංගු
4) මී උණ

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved



## තෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 08 - 2023


# විද්‍යාව - II

**උපදෙස්**

- පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.
- පිළිතුරු ලිවීම සඳහා වෙනම කඩදාසි භාවිතා කරන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් සහ අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් ද ලබාදේ.

1.

A. ශාක පරිසරයේ සුරක්ෂිතතාවය සඳහා දායක වන ප්‍රධාන ජීවී කාණ්ඩයක් ලෙස සැලකේ. ශාක වල ජෛවීය ක්‍රියාවලි කිහිපයක රූප සටහන් පහත දැක්වේ.


A


B


C


D

I. A, B, C, D වලින් දැක්වෙන ජෛවීය ක්‍රියාවලි නම් කරන්න. (ලකුණු 4)

II. A ක්‍රියාවලිය වචන සමීකරණයකින් ලියා දක්වන්න. (ලකුණු 2)


III. C හා D ක්‍රියාවලි අතර වෙනස්කම් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 2)

B. එදිනෙදා ජීවිතයේදී විද්‍යුතයේ රසායනික ඵලය ප්‍රායෝගික ව භාවිතා කරන අවස්ථාවක් පහත රූපයේ දැක්වේ.

I. රසායනික ඵලයට අමතරව ධාරා විද්‍යුතයේ වෙනත් ඵල දෙකක් ලියා දක්වන්න. (ලකුණු 2)


II. X ලෙස නම්කර ඇති ලෝහයේ නම ලියන්න. (ලකුණු 1)

III. ඇටවුමේ හැන්ද මත සිදුවන වෙනස්වීම කුමක්ද? (ලකුණු 1)




C. ධ්වනි ප්‍රභව 3 ක රූප සටහන් පහත දැක්වේ.


X


Y


Z

I. X,Y,Z හි ධ්වනි ජනනය සිදුවන්නේ කවර කොටසක් කම්පනය වීම මගින්ද? (ලකුණු 3)

II. මිනිසාට ශ්‍රවණය කළ හැකි ධ්වනියේ සංඛ්‍යාත පරාසය කෙසේ හැඳින්වේද? (ලකුණු 1)


**(මුළු ලකුණු 16)**

2. පහත දැක්වෙන්නේ මානව මුත්‍රා වාහිනී පද්ධතියේ රූප සටහනක් වේ.

I. රූප සටහනේ a,b,c,d කොටස් නම් කරන්න. (ලකුණු 2)

II. බහිස්‍රාවය යනු කුමක්ද? (ලකුණු 2)

III. පහත වගුවේ wx,y,z ස්ථානවලට ගැලපෙන හිස්තැන් සම්පූර්ණ කරන්න. (ලකුණු ½*4 = 2)




| බහිස්‍රාවී ඉන්ද්‍රිය | බහිස්‍රාවී ද්‍රව්‍යය | පිටකරන ආකාරය |
|---|---|---|
| w.......................... | යූරියා, ලවණ, ජලය | මුත්‍රා |
| පෙනහැලි | x.............................. | ප්‍රාශ්වාසය |
| සම | y.............................. | z.......................... |


IV. මුත්‍රා ගල් ඇතිවීමට හේතුවන ලවණය කුමක්ද? (ලකුණු 1)

V. මුත්‍රා වාහිනී පද්ධතිය ආශ්‍රිත වැළඳෙන රෝගාබාධ දෙකක් ලියා දක්වන්න. (ලකුණු 2)

VI. මුත්‍රා වාහිනී පද්ධතියේ නිරෝගී පැවැත්මට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් ලියා දක්වන්න. (ලකුණු 2)

**(මුළු ලකුණු 11)**

3. A. 8 ශ්‍රේණියේ සිසුන් කණ්ඩායමක් විද්‍යාගාරය පිටුපස මිදුලෙහි තනා තිබූ කොම්පෝස්ට් කොටුවක් (ජීව කොටු ක්‍රමය ) පහත දැක්වේ.



i. ක්ෂුද්‍ර ජීවීන් යන්න හඳුන්වන්න. (ලකුණු 2)

ii. මෙම කොටුව තුල ක්‍රියාකාරී විය හැකි ක්ෂුද්‍ර ජීවී කාණ්ඩ දෙකක් ලියා දක්වන්න. (ලකුණු 2)

iii. කොටුව තුලට පාසල් වත්තෙන් එකතු කල හැකි ද්‍රව්‍ය දෙකක් ලියා දක්වන්න. (ලකුණු ½ x 2=1)

B. ක්ෂුද්‍ර ජීවීන් හා තවත් සාධක හේතුවෙන් ආහාර නරක්වීම සිදුවේ. එය අවාසිදායක තත්ත්වයකි.

i. ක්ෂුද්‍ර ජීවීන් හැරුනු කොට ආහාර නරක්වීමට බලපාන වෙනත් සාධක දෙකක් ලියන්න. (ලකුණු 2)

ii. ආහාර පරිරක්ෂණය යනු කුමක්ද? (ලකුණු 2)

iii. ආහාර පරිරක්ෂණය සඳහා යොදාගන්නා සාම්ප්‍රදායික ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

**(මුළු ලකුණු 11)**

4. A. ස්වභාවික ආපදා එදිනෙදා ජන ජීවිතයට බලපෑම් ඇතිකරයි. පහත දැක්වෙන්නේ එවැනි ආපදාවක් විස්තර කෙරෙන සංකල්ප සිතියමකි.

I. එහි a,b,c හිස්තැන් සම්පූර්ණ කරන්න.

1.මෝසම් සුළං නියමිත කාලයට නොලැබීම.
a.....................................

1. අක්‍රමවත් ඉදි කිරීම්.
b.....................................


⇒ වර්ෂා රටාව වෙනස් වීම
වර්ෂාපතන ප්‍රමාණය අඩු වීම

⇒ ජල හිඟය ⇒ c.....................

(ලකුණු 3)

II. ශ්‍රී ලංකාවට බලපාන වෙනත් ස්වභාවික විපත් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 2)

B. රාත්‍රී අහසේ තරු රටා නිරීක්ෂණය කිරීමෙන් දිශා හඳුනා ගැනීම කළ හැකි වේ. පහත දැක්වෙන්නේ එවැනි තරු රටාවකි.



I. රූපයේ දැක්වෙන තරු රටාව කුමක්ද? (ලකුණු 1)

II. මෙම තරු රටාව භාවිතා කරමින් පෘතුවියේ හඳුනා ගන්නා දිශාව කුමක්ද? (ලකුණු 1)


III. තරුවක් හා ග්‍රහලෝකයක් අතර වෙනස කුමක්ද? (ලකුණු 1)

IV. තරු අතර දුර මනින ඒකකය කුමක්ද? (ලකුණු 1)

V. රාත්‍රී අහසේ දීප්තිමත් ම තාරකාව හා එය අයත් තරු රටාව නම් කරන්න. (ලකුණු 2)

**(මුළු ලකුණු 11)**

5. සිසුන් පිරිසක් කණ්ඩායම් ක්‍රියාකාරකමකදී භාවිතා කල උපාංග හා උපකරණ කිහිපයක රූප සටහනක් පහත දැක්වේ.




I. a,b,c,f නම් කරන්න. (ලකුණු ½ × 4 = 2)

II. d,e,h,f,i උපාංගයන් භාවිතා කරමින් බල්බයක් දල්වා ගැනීමට නිර්මාණය කර ගත යුතු පරිපථය සම්මත සංකේත භාවිතයෙන් අඳින්න. (ලකුණු 4)

III. ඉහත පරිපථය භාවිතා කිරීමේ අරමුණ කුමක්ද? (ලකුණු 1)

IV. බල්බය දෙකෙලවර විභව අන්තරය මැනීමට සුදුසු උපකරණය තෝරා ඉහත පරිපථ සටහනට ම අදාල සංකේතය භාවිතා කරමින් අඳින්න. (ලකුණු 1)


V. විද්‍යුත් ධාරාව යනු කුමක්ද? (ලකුණු 1)

VI. විද්‍යුත් ධාරාව ගලා යන සම්මත දිශාව කුමක්ද? (ලකුණු 1)

VII. භාවිතයෙන් ඉවත් කළ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ස්වභාවික පරිසරයට අක්‍රමවත් ලෙස මුදා හැරීමෙන් ඇතිවන අහිතකර ප්‍රතිඵලයක් ලියා දක්වන්න. (ලකුණු 1)

**(මුළු ලකුණු 11)**

6. A ගින්නක් ඇතිවීම සඳහා බලපාන සාධක ඇසුරින් සකස් කළ සටහනක් පහත රූපයේ දැක්වේ.





I. රූපය හඳුන්වන නම කුමක්ද? (ලකුණු 1)

II. එහි a හා b සඳහා සුදුසු සාධක ලියා දක්වන්න. (ලකුණු 2)

III. ඉන්ධනයක් යනු කුමක්ද? (ලකුණු 2)

B. කුප්පි ලාම්පු දැල්ලක් රූප සටහනේ දැක්වේ.




I. රූපයේ X හා Y කලාප නම් කරන්න. (ලකුණු 2)

II. කුප්පි ලාම්පුවේ දහන ක්‍රියාවලියේ සිදුවන ශක්ති පරිණාමනය ලියා දක්වන්න. (ලකුණු 1)

III. කුප්පි ලාම්පුවේ දැල්ලෙහි සිදුවන්නේ කවර ආකාරයක දහනයක්ද? (ලකුණු 1)

IV. කුප්පි ලාම්පුව පෙරලීමෙන් හට ගන්නා ගින්න නිවීමට ජලය භාවිතා කරන්නේ ඇයි? (ලකුණු 2)

**(මුළු ලකුණු 11)**

7. A. පහත දැක්වෙන අර්ථ දැක්වීම් වලට ගැලපෙන විද්‍යාත්මක අරුත / වචනය ලියන්න

| | අර්ථ දැක්වීම | විද්‍යාත්මක වචනය |
|---|---|---|
| I. | වායු ගෝලයෙන් ජලය අවශෝෂණය කරන මුල් | |
| II. | වළාකුලකින් ඇරඹී පෘතුවියෙන් අවසන් වන විසර්ජන | |
| III. | පරිසරයේ උෂ්ණත්වය වෙනස් වුවද ශරීරයේ උෂ්ණත්වය නොවෙනස්ව පවත්වාගන්නා ජීවීන් | |
| IV. | යම් ද්‍රව්‍යක ඒකක පරිමාවක ස්කන්ධය | |
| V. | ග්‍රහලෝකයක් සූර්යයා වටා ගමන් කරන මාර්ගය | |
| VI. | චුම්භකයන් අවට චුම්භක බලය රඳා පවතින ප්‍රදේශය | |

(ලකුණු 1*6=6)

B. පහත දී ඇති ද්‍රව්‍ය සළකා ඒ ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

හැට්ට කටු

සෘජුෆෝම් (ස්ටයිරොෆෝම් ) කැබැල්ලක්

ප්ලාස්ටික් පෑන් කොපුවක්

පිහිතලයක්

පැන්සල් කූරක්

වීදුරු කූරක්

I. ඉහත ද්‍රව්‍ය අතුරින් සන්නායක හා පරිවාරක වෙන්කර හඳුනා ගැනීම සඳහා සුදුසු ඇටවුමක් ඇඳ නම් කරන්න. (ලකුණු 2)

II. ඉහත ද්‍රව්‍ය සන්නායක හා පරිවාරක ලෙස වර්ග කරන්න. (ලකුණු 1/2*6=3)

**(මුළු ලකුණු 11)**